**ශීර්ෂය 295 - වාණිජ දෙපාර්තමේන්තුව**

-----------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

------------------

### 1.1 තත්ත්වාගණනය කළ මතය

-----------------------------

වාණිජ දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වාණිජ දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජූනි 21 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තුමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ජූලි 05 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට වාණිජ දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

----------------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

### 1.6.1 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

-------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය** | | |
| (i) | ආදායම් ගණන්දීමේ නිලධාරීන් වෙනුවෙන් ආදායම් එකතු කරනු ලබන වෙනත් දෙපාර්තමේන්තු එම ආදායම් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආදායම් නොවන ලැබීම් ලෙස දැක්විය යුතු වුවත් ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව රු. 38,318,501 ක් වූ ආදායම් නොවන ලැබීම්, රු. 35,251,116 ක් වූ ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර ආදායම් වලින් ජනිත වූ මුදල් යනාදිය මුදල් ප්‍රවාහ ලෙස දක්වා තිබුණි. | දෙපාර්තුමේන්තුව විසින් සකස් කරනු ලැබූ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආදායම් නොවන ලැබීම් ලෙස රු. 35,251,116 ක වටිනාකමක් දක්වා ඇත්තේ ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව වෙනත් ලැබීම් මුළු වටිනාකමින් හරස් සටහන් ලැබීම් වටිනාකම අඩු කර මුදලින් ලැබීම පමණක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ඇතුළත් කිරීම නිසා වේ. ඉදිරියේදී මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී හරස් සටහන් ලැබීම්ද ඇතුළත් කොට දළ පදනමින් ගිණුම් සකස් කිරීමට සටහන් කර ගත් බව සඳහන් කරමි. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 06 අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වීම. |
| (ii) | ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් වටිනාකම රු. 85,286,391 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ එම වටිනාකම රු. 116,967,772 ක් ලෙස සටහන් කිරීමෙන් රු. 31,681,381 ක් වැඩියෙන් දක්වා තිබුණි. | වෙනසක් හට ගැනීමට හේතු වී ඇත්තේ පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදමින් හරස් සටහන් අඩු කර දැක්වීම හා සහනාධාර හා මාරු කිරීම් යටතේ දැක්විය යුතු සම්මාදම් හා දායක මුදල් වටිනාකම ප්‍රමාද දෝෂයකින් පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් යටතේ දැක්වීම නිසා වේ. ඉදිරියේදී මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී හරස් සටහන් ඇතුළත්ව දළ පදනමින් ගිණුම් සකස් කිරීමට හා නිවැරදී වර්ගීකරණය යටතේ දත්ත ඇතුළත් කිරීමට සටහන් කර ගත් බව සඳහන් කරමි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී නිවැරදී වර්ගීකරණය යටතේ දත්ත ඇතුළත් කිරීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| **(iii)** | ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව සහනාධාර සහ මාරු කිරීම් වියදම් වටිනාකම රු. 38,043,981 ක් වූවද මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ එම වටිනාකම රු. 952,094 ක් ලෙස සටහන් කිරීමෙන් රු. 37,091,887 ක් අඩුවෙන් දක්වා තිබුණි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දත්ත ඇතුළත් කිරීමේදී . රු 37,091,887 ක සම්මාදම් හා දායක මුදල් වටිනාකම් පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් ලෙස සටහන් වීම හේතුවෙන් රු. 37,091,887 ක වෙනසක් හට ගෙන ඇති අතර ඉදිරියේදී මෙවැනි දෝෂයන් වළක්වා ගැනීමට සටහන් කර ගත් බව සඳහන් කරමි. | එම |
| **(ආ)** | **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය**<br>----------------------------------- | | |
| **(i)** | ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව අත්තිකාරම් අයකර ගැනීම් රු. 2,447,779 ක් වූවද එම වටිනාකම රු 192,242 ක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ දක්වා තිබුණු බැවින් රු. 2,255,537 ක් අඩුවෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ගලපා තිබුණි. | ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව අත්තිකාරම් අයකර ගැනීම් වටිනාකමින් හරස් සටහන මඟින් සිදුකරනු ලබන අත්තිකාරම් අයකර ගැනීම් ඉවත් කර මුදලින් අයකර ගැනීම පමණක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ඇතුළත් කිරීම හේතුවෙන් ඔබ විසින් පෙන්වා දුන් වටිනාකමින් අඩුවීමක් සිදු වී ඇත. ඉදිරියේදී හරස් සටහන් ඇතුළත්ව සියලුම අයකර ගැනීම් මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ඇතුළත් කිරීමට සටහන් කර ගතිමි. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 06 අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| **(ii)** | ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව අත්තිකාරම් ගෙවීම් වටිනාකම රු. 3,140,090 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ එම වටිනාකම රු. 2,846,740 ක් ලෙස දක්වා තිබීමෙන් රු. 293,350 ක් අත්තිකාරම් ගෙවීම් අඩුවෙන් දක්වා තිබුණි. | ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව අත්තිකාරම් ගෙවීම් මුළු වටිනාකමින් අත්තිකාරම් බී ගිණුමට කරනු ලබන හරස් සටහන් හර කිරීම් ඉවත් කර මුදලින් ගෙවීම් පමණක් ඇතුළත් කිරීම හේතුවෙන් ඔබ සඳහන් කළ වටිනාකමින් අඩුවීමක් සිදු වී ඇත. ඉදිරියේදී අත්තිකාරම් බී ගිණුමට කරනු ලබන සියලුම හර කිරීම් මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ඇතුළත් කිරීමට සටහන් කර ගතිමි. | එම |
| **(iii)** | මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වත්කම් මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් ලෙස රු. 1,526,211 ක් දක්වා තිබුණද ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව සමාලෝචිත වර්ෂයේ වත්කම් අත්පත් කරගැනීම් රු. 1,181,127 ක් පමණක් විය. | ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව මූලධන වියදම් යටතේ වන මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම් යටතේ වන වියදම් හා හැකියා වර්ධනය යටතේ වැනි වියදම් ආයෝජන ක්‍රියාකාරකම් යටතේ ඇතුළත් කිරීම තුළින් වෙනසක් ඇති වී ඇති අතර ඉදිරියේදී නිවැරදී වර්ගීකරණය යටතේ දත්ත ඇතුළත් කිරීමට සටහන් කර ගත් බව සඳහන් කරමි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී නිවැරදී වර්ගීකරණය යටතේ දත්ත ඇතුළත් කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය**<br>-------------------------------------- | | |
| | මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ තැන්පතු ලැබීම් ලෙස රු. 358,500 ක් දක්වා තිබුණද ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව එම වටිනාකම රු. 384,350 ක් වූයෙන් වෙනස රු. 25,850 ක් විය. | මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් ජනිත වූ මුදල් ප්‍රවාහය තුළ තැන්පතු ලැබීම් දක්වා ඇත්තේ හරස් සටහන් ලැබීම් ඉවත් කර මුදලින් ලැබීම පමණක් ඇතුළත් කිරීමෙන් වන අතර හරස් සටහන් ලැබීම් ඉවත් කිරීමෙන් ඔබ විසින් පෙන්වා දුන් වෙනස සිදු වී ඇති බව සඳහන් කරමි. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 06 අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වීම. |

## 1.6.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුමෙහි 2019 දෙසැම්බර් 31 දිනට දෙපාර්තුමේන්තු පොත්වල දැක්වෙන ශේෂය හා භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත ශේෂය අතර රු. 291,366 ක වෙනසක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂය තුළදී එම වෙනස නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග නොගැනීම හේතුවෙන් තවදුරටත් රු.278,943 ක වෙනසක් පැවතුණි. | භාණ්ඩාගාර පොත් හා දෙපාර්තුමේන්තු පොත් අතර නොගැලපීමක් පවතිනුයේ පදනම් වර්ෂයේ ගිණුම් සඳහා නොවන අතර එය 2005 වර්ෂයට පෙර සිටම නොසැසඳෙන බවට නිරීක්ෂණය වී ඇත. ඒ සඳහා මේ වන විට 2007 සිට නැවත ගිණුම් සැසඳීම සිදු කරන අතර ඒ මත පදනම්ව ශේෂයන් නිරවුල් කිරීම සිදු කරනු ලබයි. තවද ගිණුම් සැසඳීමට අදාළ පරිගණක වාර්තා හා සම්බන්ධ සියලු ලේඛන සොයා ගැනීම සිදු කරන බැවින් මෙම සියලු කටයුතු වල ප්‍රගතිය මත ඊලඟ වර්ෂවල ගිණුම් නිවැරදි කිරීමට කටයුතු යොදා ඇත. | නොසැසඳීම් කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම. |

## 1.6.3 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| **ඇප ලේඛනය** | | |
| මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඉදිරියේදී ඇප ලේඛනයක් පවත්වා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව සඳහන් කරමි. | මුදල් රෙගුලාසි 891(1) සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වා ගත යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 50 (II) ප්‍රකාරව ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණවත්ව නිවැරදිවත්ව පිළියෙල කිරීම ගණන්දීමේ නිලධාරියාගේ වගකීම වූවද එසේ කටයුතු නොකිරීම හේතුවෙන් වැය විෂයන් 03 ක් සඳහා ප්‍රතිපාදිත මුදලින් සියයට 58ක සිට සියයට 96 ක් දක්වා පරාසයකින් මුලු වටිනාකම රු. 3,264,224 ක ප්‍රතිපාදන ඌන උපයෝජනය වී තිබුණි. | වැය විෂයයන් සඳහා ප්‍රතිපාදන සලසා ගෙන ඇත්තේ සැලසුම් කළ කාර්යයන් හා අරමුණු ඉටුකර ගැනීම සඳහා ප්‍රමාණවත් වන අයුරින් වන අතර සමාලෝචිත වර්ෂය තුළ වැඩසටහන් බොහොමයක් කොවිඩ් - 19 වෛරසය ව්‍යාප්ත වීම හේතුවෙන් අවලංගු කිරීමට සිදු වීම නිසා ප්‍රතිපාදන ඉතුරු වීම් සිදු වී තිබුණි. | ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණවත්ව නිවැරදිවත්ව පිළියෙල කළ යුතු වීම. |

### 2.2 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණ සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුව මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර | දෙපාර්තමේන්තුව විසින් මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් පවත්වා ගෙන යනු ලබන අතර එම පද්ධතිය ඵලදායී ලෙස පවත්වා ගෙන යාමට අවශ්‍ය වෙනස්කම් කලින් කලට සිදුකරන අතර එම කටයුතු වල ලිඛිත පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන බවට සඳහන් කරමි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධි විධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | | |
| 2020 අගොස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ ii කොටසේ 05 ඡේදය | රාජ්‍ය ආයතන විසින් ලබා දෙන සේවාවන් සඳහා අය කරනු ලබන ගාස්තු වසර 03කට වරක් සමාලෝචනය කර සියයට 15 ක උපරිමයකට යටත්ව සංශෝධනය කර භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගත යුතුයි. එසේ වුවද උකස් පනත යටතේ ණයදෙන ආයතන අනුමත කිරීම සම්බන්ධයෙන් අය කරනු ලබන රු.100,000 ක් වූ ගාස්තුව 2003 වර්ෂයෙන් පසුව සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව උකස් පනත යටතේ ණයදෙන ආයතන අනුමත කිරීම පිළිබඳ වන රු. 100,000 ක ගාස්තුව සංශෝධනය කිරීම සඳහා අදාළ රේඛීය අමාත්‍යාංශ මඟින් මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා ගැනීම සඳහා කටයුතු කර ඇත. එම අනුමැතිය ලද වහාම අදාළ ගාස්තු සංශෝධනය කිරීමට නියමිතව ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම |

## 2.4 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 ජනවාරි 01 දිනට නිලධාරීන් 05 දෙනෙකුගෙන් අයවිය යුතුව තිබූ එකතුව රු. 174,257 ක් වූ ආපදා ණය ශේෂයන්ට අදාළව කිසිදු අයකිරීමක් සමාලෝචිත වර්ෂය තුළදී සිදු කර නොතිබුණි. | මෙම නිලධාරීන් විදේශ තානාපති කාර්යාලවල සේවයේ නියුක්තව සිටි බැවින් ඔවුන්ගේ ණය වාරික අයකර ගැනීම වාණිජ දෙපාර්තුමේන්තුව මඟින් සිදු නොකරන අතර තානාපති කාර්යාල මඟින් සිදු කරනු ලබයි. | හිඟ ණය ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | | විදේශ අමාත්‍යාංශය මඟින් වාණිජ දෙපාර්තුමේන්තුවට මාසික ගිණුම් සාරාංශ මඟින් බැර කිරීම් සිදු කරනු ලබයි. මේ දක්වා විදේශ අමාත්‍යාංශය වාණිජ දෙපාර්තුමේන්තුවේ ගිණුමට බැර නොකිරීම නිසා ශේෂයන් යාවත්කාලීන කිරීමට නොහැකි විය. ණය වාරික අය කිරීම් පිළිබඳ විස්තර ලද වහාම පොත්වල සටහන් කිරිමට කටයුතු කරන බව දන්වමි. | |
| (ආ) | රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් "බී" ගිණුම අනුව නිලධාරීන් හය දෙනෙකුගෙන් රු. 12,138 ක් වැඩිපුර අය කර ගෙන තිබූ අතර ඒ සඳහා වසර 02ක් ගත වී තිබුණද විගණිත දිනය දක්වා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම ණය වාරික තුළ ඇතුළත් නිලධාරීන් දෙදෙනෙකු දැනට විදේශ දූත මණ්ඩල සේවයට අනුයුක්ත කර ඇති බැවින් ඔවුන් දෙපාර්තුමේන්තුවේ සේවයට වාර්තා කළ වහාම වැඩිපුර අයකර ගත් මුදල් නැවත ලබා දීමට කටයුතු කරන අතර දැනට දෙපාර්තුමේන්තුව තුළ සේවය කරන නිලධාරීන් තිදෙනාගේ වැඩිපුර අය කර ගැනීම් නැවත ලබා දීමට කටයුතු කරන බව දන්වමි. | වැඩිපුර අයකර ගන්නා ලද ණය මුදල් නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව 2018 අංක 02 දරන ප්‍රපාතන විරෝධී හා ප්‍රතිතෝලන බදු පනත හා 2018 අංක 03 දරන ආරක්ෂණ පියවර පනත් ක්‍රියාත්මක කිරීමට අදාළ රෙගුලාසි, අභ්‍යන්තර චක්‍රලේඛ හා මාර්ගෝපදේශ නිකුත් කිරිමට සැලසුම් කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම කාර්යයන් නිමකර නොතිබුණි. | නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව විසින් නිසි සංස්කරණයන් කිරීමෙන් අනතුරුව, අදාළ රෙගුලාසි නීතිපති දෙපාර්තමේන්තුව වෙත අනුමැතිය සඳහා යොමු කර ඇත. නිසි බලධාරීන්ගේ උපදෙස් වරින් වර ලබා ගනිමින්, අභ්‍යන්තර චක්‍රලේඛ හා මාර්ගෝපදේශ මේ වන විට සකස් කර අවසන් අතර | පනත් ක්‍රියාත්මක කිරීමට අදාළ රෙගුලාසි, අභ්‍යන්තර චක්‍රලේඛ හා මාර්ගෝපදේශ නිකුත් කිරීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | | නීතිපති දෙපාර්තමේන්තුව වෙත අනුමැතිය සඳහා යොමු කිරීමට නියමිතය. | |
| (ආ) | විද්‍යුත් පෝලිම් කළමණාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රභවස්ථාන සහතික නිකුත් කිරීමට අදාළ අනෙකුත් සේවාවන් වන ආශ්‍රිත ලේඛන අනුමත කිරීම ඇතුළුව තීරුබදු කෝටා සහතික නිකුත් කිරීම සහ සමාගම් ලියාපදිංචි කිරීම් පද්ධතියක් සකස් කර ක්‍රියාත්මක කිරීම සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම කර නොතිබුණි. | විද්‍යුත් පෝලිම් කළමණාකරණ පද්ධතියේ මූලික කාර්යයන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ලැබූවද එහි අනෙකුත් සේවාවන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ කාර්යයන් ඉටු කිරීමේදී සමාලෝචිත වර්ෂයේ පැවති කෝවිඩ් 19 උවදුරු බලපෑම හේතුකොටගෙන නියමිත කාලරාමුව තුළ එම කාර්යයන් ඉටු කිරීම පිළිබඳ ප්‍රමාදයක් ඇතිවිය. | සැලසුම්ගත කාර්යයන් නියමිත කාලරාමුව තුළ ඉටු කිරීමට කටයුතු කළ යුතු වීම. |

**3.2 කළමනාකරණ දූර්වලතා**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| උගස් පණත යටතේ ණයදෙන ආයතන ලෙස අනුමැතිය ලබා ගැනීමට නව අයදුම්පත් ඉදිරිපත් කළ ආයතන 05 කට හා ඉකුත් වර්ෂයේදී වාණිජ අධ්‍යක්ෂක ජනරාල්වරයා විසින් වර්ෂයක කාල පරිච්ඡේදයක් සඳහා පමණක් ණය දීමේ ආයතන ලෙස අනුමත කරන ලද ආයතන 02 කට අදාලව ලබා දුන් අනුමැතිය අවසන් වීමට පෙර නැවත කාල දීර්ඝ කිරීම අමාත්‍යවරයා විසින් පත්කල යුතු ණය දෙන ආයතන අනුමත කිරීමේ කමිටු නියමිත පරිදි පත්කර නොතිබුණි. ඒ හේතුවෙන් අදාළ අනුමැතීන් ලබා දී නොතිබුණි. | ණය දෙන ආයතන අනුමත කිරීමේ මණ්ඩලය, අමාත්‍යවරයා විසින් අංක 2220/56 හා 2021 මාර්තු 25 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් පත්කර ඇත. එහි පළමු රැස්වීම 2021 අප්‍රේල් 29 වන දින පැවැත්වූ අතර ඉදිරි රැස්වීම් කඩිනමින් පවත්වා අයදුම්කරුවන්ගේ යෝග්‍යතාවය සලකා බැලීමට කටයුතු කරනු ලැබේ. | ණය දෙන ආයතන සඳහා අදාළ අනුමැතීන් කඩිනමින් ලබා දීමට කටයුතු කළ යුතු වීම. |

## 4. යහපාලනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 (1) වගන්තිය හා 40 (2)(1) වගන්තිය ප්‍රකාර ගණන් දීමේ නිළධාරියා විසින් එම දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීම පිණිස සුදුසු විගණකවරයෙකු පත් කරනු ලැබිය යුතුයි. එසේ වුවද පනතේ විධිවිධාන ප්‍රකාරව සමාලෝචිත වර්ෂය දක්වාම අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද රේඛීය අමාත්‍යාංශය විසින් හෝ අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි. | මෙම දෙපාර්තමේන්තුවට අභ්‍යන්තර විගණන තනතුරක් අනුමත කර දෙන ලෙස ඉල්ලා මුදල් රෙගුලාසි 71 අනුව අයදුම්පතක් කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇත. | අභ්‍යන්තර විගණනයක් කාලීනව ඉටු කළ යුතු වීම. |

## 5. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්යය මණ්ඩලය 152 ක් වුවද තථ්‍ය කාර්යය මණ්ඩලය 114 ක් විය. ඒ අනුව විශේෂ හා පළමු ශ්‍රේණියේ තනතුරු 03 ක්ද නියෝජ්‍ය / සහකාර වාණිජ අධ්‍යක්ෂ තනතුරු 06 ක්ද ඇතුළව පුරප්පාඩු තනතුරු 38 ක් පැවතුණි. | ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 11න් 6ක් සඳහා බඳවා ගැනීමට ගැසට් කර ඇති අතර අදාළ විභාගය විභාග දෙපාර්තමේන්තුව මඟින් පැවැත්වීමට නියමිතය. ප්‍රාථමික, ද්විතීක, තෘතීක මට්ටමේ තනතුරු සඳහා පුරප්පාඩු සම්පූර්ණ කර දෙන මෙන් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂජනරාල්ගෙන් ඉල්ලා ඇත. | අත්‍යවශ්‍ය තනතුරු සඳහා පවතින පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වීම. |